සීමාසහිත හාරිස්පත්තුව දකුණ විවිධ සේවා සමුපකාර සමිතිය

සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) - iii

සීමාසහිත හාරිස්පත්තුව දකුණ විවිධ සේවා සමුපකාර සමිතියේ සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) තනතුර සඳහා මහනුවර දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචි සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් 2026-11-13 දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) - III **තනතුරු සංඛ්‍යාව 01**

වැටුප් පරිමාණ අංක : E.L-02:01

වැටුප් පරිමාණය : 39,200-635×10 - 955×10 - 1,270×10 = 67,800/-

වයස් සීමාව : 18-45

සුදුසුකම් :-

අ). අභ්‍යන්තර විගණක තනතුරක වසර 04 ක සීමා සේවා පළපුරුද්දක් / ග්‍රාමීය බැංකු අභ්‍යන්තර විගණක තනතුරක වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම / පොත් තබන්නා තනතුරක වසර 06 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම / ග්‍රාමීය බැංකු කළමනාකාර තනතුරක වසර 06 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

හෝ

ආ) පිළිගත් ආයතනයක ගණකාධිකරණ / බැංකු හා මුදල් කළමනාකරණය පිළිබඳ මාස 09 කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ඩිප්ලෝමාවක් සමත් වීම සමග අභ්‍යන්තර විගණක තනතුරක වසර 02 ක / ග්‍රාමීය බැංකු අභ්‍යන්තර විගණක තනතුරක වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් / කළමනාකරු (ව්‍යාපෘති) තනතුරක වසර 03 ක සීමා සේවා පළපුරුද්දක් තිබීම / ග්‍රාමීය බැංකු කළමනාකරු තනතුරක වසර 03 ක සීමා සේවා පළපුරුද්දක් තිබීම / ගිණුම් සහකාර 1 තනතුරට වසර 06 ක සීමා සේවා පළපුරුද්දක් තිබීම.

හෝ

ඇ) පිළිගත් විශ්වවිද්‍යාලයක / පිළිගත් ආයතනයක ගණකාධිකරණ / වාණිජ / කළමනාකරණය පිළිබඳ උපාධියක් සමත් වී තිබීම / උසස් තාක්ෂණ ආයතනයේ ගණකාධිකරණය / ව්‍යාපාර පරිපාලනය යන ඩිප්ලෝමාවන්ට අදාළ වසර 2 1/2 ක පාඨමාලාවක් සමත් වී තිබීම.

හෝ

ඇ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අදියර I (Chartered Level I) / ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ අදියර III (A.A.T. Level III) සමත් වීම.

නියමිත අයදුම්පත්‍රය සමුපකාර සමිතියේ ප්‍රධාන කාර්යාලයට රුපියල් 300/- ක් ගෙවා ලබාගත හැකිය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත සමග උප්පැන්න සහතිකය, අධ්‍යාපන සහතික, පළපුරුද්ද පිළිබඳ සහතික, ග්‍රාම නිලධාරී සහතිකය, චරිත සහතිකය, ජාතික හැඳුනුම්පත යනාදියේ සහතික කළ ඡායා පිටපත් සමග "ගරු සභාපති, සී/ස හාරිස්පත්තුව දකුණ විවිධ සේවා සමුපකාර සමිතිය, හැදෙනිය, වැරැල්ලගම" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

ගරු සභාපති,
සී/ස හාරිස්පත්තුව දකුණ විවිධ සේවා සමුපකාර සමිතිය,
හැදෙනිය,
වැරැල්ලගම.
දුරකථන අංකය - 081-2460733
E-mail– info.hp.mpcs@gmail.com